

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය



## දැක්ම

ශ්‍රී ලංකාවේ පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ ප්‍රධාන ජාතික ආයතනය මෙන් ම රට පුරා විහිදුන නවීන පුස්තකාල හා තොරතුරු සේවා ජාලයක මධ්‍යස්ථානය බවට පත්වීම.



# මෙහෙවර

දැනුවත් සමාජයක් බිහි කිරීම උදෙසා

ජාතියේ බුද්ධිමය උරුමය සුරැකීම


ජාතික පුස්තකාල හා විඥාපන සේවා පද්ධතිය සංවර්ධනය

පුස්තකාල සේවා කාර්යක්ෂමතාව පිණිස තොරතුරු සහ

සන්නිවේදන තාක්ෂණය භාවිතයට දිරි දීම

ග්‍රන්ථ විඥාපන පහසුකම් සැපයීම සහ

ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා අනුග්‍රහය දැක්වීම



# අරමුණු හා පරමාර්ථ

- ශ්‍රී ලංකාවේ සියලුම වර්ගයේ පුස්තකාලවලට නායකත්වය ලබාදීම හා ජාතියට තොරතුරු සැපයීමේ දී නායකත්වය ලබාදීම.
- ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල පළකරනු ලබන මුද්‍රිත හා මුද්‍රිත නොවන මාධ්‍යවල සම්පූර්ණ ජාතික එකතුවක් ගොඩනැගීම, සංවර්ධනය හා පවත්වාගෙන යාම.
- ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන සේවා පිහිටුවීම හා පවත්වාගෙන යාම.
- පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ කටයුතු සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම.
- දේශීය ග්‍රන්ථ නිෂ්පාදනය දිරිගැන්වීම හා කියවීම ප්‍රවර්ධනය.
- පුස්තකාල හා විඥාපන සේවා සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම දිරිගැන්වීම.
- පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ ජාතික කලාපීය හා ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගීතාව වර්ධනය කිරීම.
- සමාජයේ විවිධ කණ්ඩායම්වල සංස්කෘතික අනන්‍යතාවට ගරු කෙරෙන පරිදි පුස්තකාල හා තොරතුරු සේවා සංවිධානය කිරීම.
- ශාස්ත්‍රීය පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම හා සේවා සංවිධානය කිරීම.



## ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ගෘහ නිර්මාණාත්මක සංකල්පය

ගස යනු ස්වභාව ධර්මයේ වඩාත් ප්‍රකට සංකේතය වේ. ඒ මගින් ආරක්ෂාව, සෙවන, පෝෂණය හා නිසල පරිසරයක් ලබාදේ. බුදු දහම තුළ ද ගසට විශේෂ වැදගත්කමක් ලැබේ. ජාතික පුස්තකාල ගොඩනැගිල්ල සැලසුම් කළ විශේෂඥ ගෘහ නිර්මාණ ශිල්පියා එය විශාල ගසක ස්වරූපයෙන් දැකීම සතුටට කරුණකි.


ගසක ආකාරයෙන් සැලසුම් කිරීමෙන් නිරූපනය වන්නේ දේශීය භූමිය තුළ වර්ධනය වන ජාතික සම්පතකි. එමගින් දිගුකාලීන පැවැත්මද නිරූපනය වේ. ගසක අරටුව මෙන් ජාතික පුස්තකාලයේ ද ඇතුළත ගර්භය තුළ තැන්පත්ව ඇත්තේ අපගේ ජාතික නිධානයයි. එනම් වර්තමාන හා අනාගත ප්‍රයෝජනයට පාඨක ප්‍රජාව සඳහා මුද්‍රිත හා මුද්‍රිත නොවන මාධ්‍යයෙන් පවතින පොත්, සඟරා, ලේඛන, පුවත්පත් හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සම්භාරයයි.

ඉංග්‍රීසි කවියෙකුවන ඇන්ඩෲ මාවෙල්ගේ වචනවලින් ප්‍රකාශ කළහොත් ''හරිත සෙවනක් තුළ හරිත සිතුවිල්ලක්'', යන හැඟීම ඇතිවන ආකාරයට ජාතික පුස්තකාලය ස්වාභාවික ආලෝකයෙන් යුක්ත වන අතර පාඨකයින්ට තම වෙහෙස නිවාගැනීමට අවට ඇති තණතිල්ල හා වෘක්ෂලතා උපකාරීවේ. පුස්තකාලයාධිපතිවරුන්ට හා කාර්ය මණ්ඩලයට එවැනි පරිසරයක් තුළ

සේවය කිරීමට හැකිවීම නිසා ඔවුන්ට ඵලදායි ලෙස සේවා ලබාදීමට ද හැකියාවක් ලැබේ.

මෙම ගොඩනැගිල්ල සැලසුම් කළ ගෘහ නිර්මාණ ශිල්පියාගේ වචනවලින්ම කිවහොත් දළදා මාලිගාව හා වෙනත් වැදගත් විහාරස්ථානවල සාම්ප්‍රදායික ස්වරූපය මෙම ගොඩනැගිල්ල තුළින් නිරූපනය වේ. කෞතුකාගාරය, නිදහස් මන්දිරය, කොළඹ නගර සභාව හා නව පාර්ලිමේන්තුව වැනි ජාතික ගොඩනැගිලි ආකාරයෙන් අපගේ ජාතියේ සංස්කෘතික අපේක්ෂාවන් හා ඇගැයීම්වල සංකේතයක් ලෙස නිර්මාණය කිරීමට මහාචාර්ය මයිකල් බ්‍රොන් මහතා බලාපොරොත්තු විය.

ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය දැව, දේශීය උළු හා ගඩොල් යොදා ගන්නා ලදි. ගොඩනැගිල්ලේ දැකිය හැකි බිතුසිතුවම් දේශීය කලා ශිල්පීන් විසින් නිර්මාණය කරන ලද අතර ඒ තුළින් දේශීය වෘක්ෂලතා නිරූපණය කර ඇත. මෙය අප රටේ විශාලතම බිතු සිතුවම ලෙස ද සැලකේ.



# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය




1990 අප්‍රේල් 27 වන දින ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 1990 අප්‍රේල් 27 වන දින එවකට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් විවෘත කරන ලදී. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කිරීම ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික, සංස්කෘතික, පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයේ වැදගත් පියවරක් සනිටුහන් කරයි.

1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනත මගින් ආරම්භක අවධියේ දී ජාතික පුස්තකාලය සඳහා නෛතික පදනම ලැබිණි. වර්ෂ 1997 දී එවකට අධ්‍යාපන අමාත්‍යාවරයා වශයෙන් කටයුතු කළ ආචාර්ය රිචඩ් පතිරණ මහතා විසින් නව පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. 1998 අංක 51 දරන පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ බලතල හා වගකීම් පැහැදිලි ලෙස දක්වන ලද අතර එය දිගුකාලීන අවශ්‍යතාවක් සපුරාලීමක් ලෙස සැලකිය හැකිය. මෙම පනත මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ නාමය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය වශයෙන් වෙනස් වූ අතර එය ආයතනයේ කාර්යයන් අනුව සලකන විට වඩා යෝග්‍ය බව පෙනේ. කෙසේ වූවද එහි නම තවමත් ජාතික පුස්තකාලය ලෙස පොදුවේ භාවිත කෙරේ. මෙම නව ආයතනය සංවිධානය කිරීමත්, රටට හා මහජනතාවට හඳුන්වා දීමත් දැවැන්ත කාර්යභාරයක් බවට පත්ව තිබේ.

## පිහිටීම



# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පාඨක සේවාවන්

ජාතික පුස්තකාලය ප්‍රධාන වශයෙන්ම පර්යේෂණ හා විමර්ශන පුස්තකාලයක් වන අතර එය රටේ ප්‍රධානතම පුස්තකාලය ලෙස සැලකේ. පුස්තකාල ජාල, තොරතුරු මධ්‍යස්ථාන හා සම්පත් මධ්‍යස්ථාන මගින් සියලුම ශ්‍රී ලාංකිකයින්ට පුස්තකාල සම්පත් හා තොරතුරු ලබාදීමට ජාතික පුස්තකාලය කටයුතු කරයි. ජාතික පුස්තකාලය මහල් පහකින් සමන්විත වන අතර ගොඩනැගිල්ලේ සම්පූර්ණ වපසරිය වර්ගමීටර් 11,250 ක් වේ. පොත් රාක්ක දිග ප්‍රමාණය මීටර් 866 ක් පමණ වේ. කියවීම් ශාලා තුනක් ඇති අතර එහි ආසන ප්‍රමාණය 320 ක් වේ. මීට අමතරව ආසන 145 කින් සමන්විත වායු සමීකරණය කළ ශ්‍රවණාගාරය, ආසන 30 කින් සමන්විත සම්මන්ත්‍රණ ශාලාව යන අංගවලින් ද ජාතික පුස්තකාලය සමන්විත වේ.

පොත් මිලියන දහයක් පමණ (10,000,000) තැන්පත් කළ හැකි ඉඩ ප්‍රමාණයක් ජාතික පුස්තකාලය සතුව පවතී. දැනට ඇති පොත් ප්‍රමාණය දළ වශයෙන් මිලියනයක් (1,00,000) ක් පමණ වන අතර එය අනාගත ජාතික පුස්තකාල එකතුවේ ආරම්භක එකතුව ලෙස සැලකිය හැකිය.

ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ වැඩසටහන මගින් ජාතික පුස්තකාලය එහි එකතුව ගොඩනැගීම 1970 වර්ෂයේ සිට ආරම්භ කර තිබේ. ජාතික පුස්තකාලය සඳහා පොත්පත් අත්පත් කරගන්නා මාර්ග වශයෙන් මිල දී ගැනීම, තැන්පතු පිටපත්, පරිත්‍යාග හා හුවමාරු ක්‍රමය යොදා ගනු ලැබේ. මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනතේ 1976 වර්ෂයේ සංශෝධනය අනුව සෑම ප්‍රකාශනයකින්ම පිටපතක් ජාතික පුස්තකාලයට ලබාගැනීම සිදුවේ.



# විවෘතව තබන දින හා වේලාවන්

සඳුදා, බදාදා, සිකුරාදා හා සෙනසුරාදා දින
පෙ. ව. 8.30 සිට පස්වරු 4.15 දක්වා ද

අඟහරුවාදා හා බ්‍රහස්පතින්දා දින
පෙ. ව. 8.30 සිට ප. ව. 6.15 දක්වා ද
ජාතික පුස්තකාලය විවෘතව පවතී.

ඉරිදා හා අනෙකුත් රජයේ නිවාඩු දිනවල වසා තබනු ලැබේ.

# පාඨක ලියාපදිංචිය

ජාතික පුස්තකාල සේවා හා පහසුකම් භාවිත කිරීමට අපේක්ෂා කරන සෑම පාඨකයෙක් ම එහි සාමාජිකත්වය ලබාගත යුතු වේ.

# සාමාජික ගාස්තු

**තාවකාලික සාමාජිකත්වය**

| | | |
|---|---|---|
| එක් දින සාමාජිකත්වය සඳහා | රු. | 20.00 |

**ස්ථිර සාමාජිකත්වය**


| | | |
|---|---|---|
| ත්‍රෛමාසික සාමාජිකත්වය සඳහා | රු. | 100.00 |
| වාර්ෂික සාමාජිකත්වය සඳහා | රු. | 350.00 |
| යාවජීව සාමාජිකත්වය සඳහා | රු. | 1000.00 |
| වර්ෂයක් සඳහා ආයතනික සාමාජිකත්වය | රු. | 2500.00 |

ශ්‍රී ලාංකේය ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා යාවජීව සාමාජිකත්වය නොමිලේ

පාඨක කැමැත්ත අනුව සුදුසු සාමාජිකත්ව වර්ගයක් තෝරාගත හැකිය. සාමාජිකත්ව කාලසීමාව අවසානයේ දී අදාළ ගාස්තුව ගෙවා සාමාජිකත්වය අලුත් කරගත යුතු වේ.

# ජාතික පුස්තකාල එකතුව

## විමර්ශන එකතුව



සාමාන්‍ය හා විෂය විශ්වකෝෂ, ඉංග්‍රීසි භාෂා හා වෙනත් භාෂා ශබ්දකෝෂ, ද්විභාෂා ශබ්දකෝෂ හා වෙනත් විෂය ශබ්දකෝෂ, පාරිභාෂික ශබ්දමාලා, වාර්ෂික ග්‍රන්ථ, තොරතුරු සංග්‍රහ, ජාත්‍යන්තර හා ජාතික චරිතාපදාන, සිතියම්, ගැසට්, මාර්ගෝපදේශ ග්‍රන්ථ, අත්පොත්, බ්‍රිතාන්‍ය විශ්වකෝෂය (Brittanica) හා එන්කාටා (Encarta) (සංයුක්ත තැටි ස්වරූපයෙන්) ආදී මූලාශ්‍රවලින් විමර්ශන එකතුව සමන්විත වේ. මීට අමතරව ජාතික, විෂය හා වෙළඳ ග්‍රන්ථ නාමාවලි, අනුක්‍රමණිකා, විද්‍යා උපහැරණ අනුක්‍රමණිකාව, සමාජ විද්‍යා උපහැරණ අනුක්‍රමණිකාව වැනි අනුක්‍රමණිකා සහ පුස්තකාල හා විඥාපන විද්‍යා සාර සංග්‍රහය (LISA) වැනි සාර සංග්‍රහ ආදී ජාත්‍යන්තර මට්ටමේ ද්විතීයික මූලාශ්‍රවලින් සමන්විත මූලික විමර්ශන එකතුවක් ද ඇත.

## ශ්‍රී ලංකා එකතුව

1976 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය තැන්පතු පුස්තකාලයක් වන අතර 1885 මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පිටපත් පහෙන් (05) එක් පිටපතක් ජාතික පුස්තකාලයට ලැබේ. කෙසේ වූවද ශ්‍රී ලංකා එකතුව ගොඩනැගීම ආරම්භ වූයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටවූ 1970 වර්ෂයේ සිටය. ශ්‍රී ලංකා එකතුව පෝෂණය කිරීම සඳහා ප්‍රකාශන ලබාගන්නා අනෙකුත් ක්‍රම වන්නේ මිලදී ගැනීම, ප්‍රකාශන හුවමාරුව හා පරිත්‍යාග යන ක්‍රම වේ. අනෙකුත් සාමාන්‍ය විමර්ශන මූලාශ්‍ර



හැරුණු විට ශ්‍රී ලංකාවේ පළවන ප්‍රකාශන, ශ්‍රී ලංකාව පිළිබඳව විදේශ රටවල පළවන ප්‍රකාශන හා ශ්‍රී ලාංකික කර්තෘවරුන් විසින් විදේශයන්හි දී පළකරනු ලබන ප්‍රකාශන ලබාගැනීමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ප්‍රමුඛතාවක් දක්වයි. මීට අමතරව විද්වතුන්ගේ පෞද්ගලික එකතුවලින් මෙන්ම ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ආයතන එකතුවලින් ද ජාතික පුස්තකාලයේ ශ්‍රී ලංකා එකතුව සමන්විත වේ.

## පුස්කොළ පොත් එකතුව

ප්‍රමාණයෙන් කුඩා වුවද ජාතික පුස්තකාලය සතුව සැලකිය යුතු පුස්කොළ පොත් එකතුවක් ඇති අතර එය අඛණ්ඩව වර්ධනය කෙරේ. මෙම එකතුව සිංහල, පාලි හා සංස්කෘත යන භාෂාවලින් ලියැවී ඇති අතර බුද්ධාගම, බෞද්ධ සූත්‍ර ධර්ම, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය, සිංහල භාෂාව හා සාහිත්‍යය, ඉතිහාසය, ජ්‍යොතිෂය, ජාතක කතා, යන්ත්‍ර මන්ත්‍ර වැනි විෂයයන්ගෙන් සමන්විත වේ. දශක කිහිපයකට පෙර පළකරන ලද සාහිත්‍ය කෘති මෙන්ම ජාතික වැදගත්කමකින් යුත් අත්පිටපත්වලින් ද මෙම එකතුව සමන්විත වේ.



# වාර සඟරා එකතුව




කාලීන තොරතුරු ලබා ගැනීමේ දී වාර සඟරා ලිපි අතිශයින් ප්‍රයෝජනවත් වේ. එබැවින් පර්යේෂණ සම්බන්ධයෙන් සලකන විට වාර සඟරාවලට විශාල වැදගත්කමක් හිමි වේ. ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තිය අනුව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවලින් ශ්‍රී ලංකාවේ පළවන සියලුම වාර සඟරා ජාතික පුස්තකාලය සඳහා ලබාගනු ලැබේ. සමාජීය විද්‍යා, මානව ශාස්ත්‍ර විද්‍යා හා තාක්ෂණය සහ පුස්තකාල හා විඥාපන විද්‍යා යන විෂයයන්ට අදාළ විදේශ වාර සඟරා ද ලබාගනු ලැබේ. මිලදී ගැනීම, හුවමාරු ක්‍රමය හා පරිත්‍යාග යන ක්‍රම මගින් වාර සඟරා ලබාගනු ලැබේ.





# පුවත්පත් එකතුව

1976 වර්ෂයේ සිට මේ දක්වා මෙරට පළවූ ජාතික පුවත්පත් එකතුවක් ජාතික පුස්තකාලය සතුවන අතර එය පර්යේෂකයින්ගේ මෙන්ම සාමාන්‍ය පාඨකයින්ගේ නොමද අවධානයට ලක්වූ එකතුවකි. දනට ඇති පුවත්පත් එකතුව පුවත්පත් නාම 1677 කින් පමණ සමන්විත වේ.

## පුවත්පත් ලිපි කැපුම් එකතුව

පුවත්පත්වල පළවන විශේෂ ලිපිවල හා ප්‍රවෘත්තිවල පුවත්පත් කැපුම් එකතුවක් ජාතික පුස්තකාලය සතුව ඇත. මෙම පුවත්පත් කැපුම් එකතුව විෂයයන් 127 ක් පිළිබඳ විද්වත් ලිපි හා විශේෂාංග ලිපිවලින් සමන්විත වේ. කාලීන මාතෘකා පිළිබඳ ලිපිවලට විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. මෙම එකතුව විෂයයන් අනුව ක්‍රමානුකූලව සකස් කර ඇති අතර සෑම විෂයයකටම අනුක්‍රමණිකාවක් ද සකස් කර ඇත.







## පශ්චාද් උපාධි නිබන්ධන එකතුව


පශ්චාද් උපාධි නිබන්ධන එකතුව ගොඩනැගීම ආරම්භ වූයේ 1999 වර්ෂයේදී ය. ශ්‍රී ලාංකිකයින් විසින් ශ්‍රී ලාංකික හෝ පිළිගත් විදේශීය විශ්වවිද්‍යාලවලට හෝ සමාන ආයතනවලට ඉදිරිපත් කරන ලද දර්ශන විශාරද (PhD) දර්ශනපති (Mphil) ශාස්ත්‍රපති (MA) උපාධි නිබන්ධන ජාතික පුස්තකාලයට ලබාගනු ලැබේ. නිබන්ධනවල විෂයය ශ්‍රී ලංකාවට අදාළ විය යුතුය. 1980 වර්ෂයට පසු ඉදිරිපත් කරන ලද නිබන්ධන ලබාගැනීමට ප්‍රමුඛතාවක් දක්වනු ලැබේ.

## ජනශ්‍රැති එකතුව



ලේඛන හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන් වාචික සම්ප්‍රදාය ආරක්ෂා කිරීම සඳහා වන මෙම එකතුව වැදගත් එකතුවක් ලෙස සැලකිය හැකිය. ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ ජනශ්‍රැති විශේෂඥයෙකු වූ පීටර් විජේසිංහ මහතා විසින් රචිත අත්පිටපත් රාශියක් මෙම එකතුවෙහි ඇතුළත් වේ. සිංහල ජන ගී, සිංහල ජනකතා, සිංහල පුරාවෘත්ත, සිංහල සිරිත් විරිත් හා උත්සව, පුදපූජා, ශ්‍රී ලංකාවේ දෙවිවරු හා යක්ෂයින්, බුලත් පිළිබඳ සිරිත් විරිත්, සාම්ප්‍රදායික සූපශාස්ත්‍ර, ජන විශ්වාස, වී වගාව පිළිබඳ ලිපි, හේන් වගාව පිළිබඳ ලිපි, කෘෂිකාර්මික සිරිත් විරිත්, ශ්‍රී ලංකාවේ ගම්වල නම්, ශ්‍රී ලංකාවේ ස්ථාන නාම, අලි ඇතුන් පිළිබඳ රචනා, මීමැසි පාලනය, දෙවි දේවතාවුන් ආදී ජන සංස්කෘතිය පිළිබඳ ලේඛනවලින් ජනශ්‍රැති එකතුව සමන්විත වේ.


## අශ්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ එකතුව



අශ්පර්ශනීය සංස්කෘතික උරුමය යුනෙස්කෝ ව්‍යාපෘතියක් වන අතර මෙමගින් ගීත, සංගීතය, නාට්‍ය, කුසලතා, උත්සව, කලාශිල්ප ආදී ස්පර්ශ කළ නොහැකි සංස්කෘතික අංග සංරක්ෂණය කිරීම සිදුවේ. අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම පිළිබඳ ව්‍යාපෘතියට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ද සම්බන්ධ වේ. අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ එකතුවක් ගොඩනැගීම මේ යටතේ ජාතික පුස්තකාලය ඉටු කරන ලද එක් කාර්යයකි.

## පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව

පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රධාන ආයතනය වශයෙන් ජාතික පුස්තකාලය විසින් පුළුල් හා කාලීන පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුවක් පවත්වාගෙන යනු ලැබේ. ජාතික පුස්තකාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව රට තුළ ඇති මෙම ක්ෂේත්‍රයේ ඉහළ මට්ටමේ එකතුවක් ලෙස සැලකේ. පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ විශ්ව කෝෂ, පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට අදාළ පාරිභාෂිත ශබ්ද මාලා, පොත්, සමුළු වාර්තා හා සියලුම ප්‍රධාන පෙළේ වෘත්තීය සඟරා වැනි විමර්ශන මූලාශ්‍රවලින් මෙම එකතුව සමන්විත වේ. පුස්තකාල හා විඥාපන විද්‍යා සාර සංග්‍රහය (LISA) තුළ මෙම ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ප්‍රකාශන පිළිබඳ කාලීන තොරතුරු ඇතුළත් වේ. පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ ආයතනවල ගුරුවරුන් හා සිසුන් සඳහා මෙම එකතුව භාවිත කිරීමට විශේෂ පහසුකම් සලසා ඇත.





## ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන එකතුව




පනත්, ආඥාපනත්, පාර්ලිමේන්තු විවාද (හැන්සාඩ් වාර්තා), සැසි වාර්තා, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා, ගැසට් පත්‍ර, ශ්‍රී ලංකා නීති වාර්තා, නව නීති වාර්තා, පරිපාලන වාර්තා, කොමිෂන් වාර්තා, අත්පොත්, මාර්ගෝපදේශ ග්‍රන්ථ, තොරතුරු සංග්‍රහ, ව්‍යාපෘති වාර්තා, වැනි රජයේ විවිධ ආයතනවලින් පළකරන ප්‍රකාශනවලින් මෙම එකතුව සමන්විත වේ. ජනාධිපති ලේකම් කාර්යාලය, පාර්ලිමේන්තුව, මහා භාණ්ඩාගාරය, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, ජාතික ආයතන, පළාත් පාලන ආයතන, රාජ්‍ය බැංකු මෙම රජයේ ආයතන වේ.

## ගැසට් එකතුව

1888 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පළවූ ගැසට්වල සම්පූර්ණ එකතුවක් ජාතික පුස්තකාලය සතුව ඇත. 1888 සිට 1976 දක්වා වර්ෂවල ගැසට් පරිත්‍යාග වශයෙන් ලබාදෙන ලද්දේ රජයේ ප්‍රකාශන කාර්යාංශය විසිනි. 1976 සිට තැන්පතු පිටපත් වශයෙන් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් ලැබෙන පිටපත්වලින් ගැසට් එකතුව පෝෂණය වේ.



## සිතියම් එකතුව




ශ්‍රී ලංකාවට අදාළ සිතියම් පිළිබඳ සම්පූර්ණ එකතුවක් ගොඩනැගීමට ජාතික පුස්තකාලය විශේෂ අවධානයක් යොමු කර ඇත. සිතියම් එකතුව ගොඩනැගීම ආරම්භ කරන ලද්දේ 1980 වර්ෂයේ දී ය. මෙම සිතියම්වලින් වැඩි ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කර ඇත්තේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් විවිධ පරිමාණයන්ට අනුවය. ලෝක සිතියම්, ලංකා සිතියම්, ඉන්දියාව හා වෙනත් විවිධ රටවල සිතියම්වලින් මෙම එකතුව සමන්විත වේ. එනම් අඟලේ සිතියම් පරිමාණය 1:63500 ශ්‍රී ලංකා මෙට්‍රික් සිතියම් පරිමාණය 1:50000 ඉඩම් භාවිත සිතියම්, ඓතිහාසික සිතියම්, චන්ද්‍රිකා සිතියම්, මාර්ග සිතියම්, පළාත් සිතියම්, දිස්ත්‍රික්ක සිතියම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සිතියම් ආදිය මෙම එකතුවට අයත් වේ.

# විශේෂ පොත් එකතු

මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ සූරීන්ගේ පොත් එකතුව විශේෂ පොත් එකතු අතර විශාලතම එකතුව වේ. මෙම එකතුව ජාතික පුස්තකාලය වෙත පරිත්‍යාග කරන ලද්දේ මාර්ටින් වික්‍රමසිංහ භාරකාර මණ්ඩලය විසිනි. ඔහුගේ පෞද්ගලික පොත් එකතුව, පොත්වල අත්පිටපත්, ලියන මේසය, යතුරු ලියනය, පෑන, හාන්සි පුටුව හා වෙනත් කෞතුක භාණ්ඩවලින් මෙම විශේෂ එකතුව සමන්විත වේ.

මීට අමතරව විද්වතුන් රැසකගේ එකතු මෙන් ම ජාතික හා ජාත්‍යන්තර ආයතන රැසක එකතුවලින් ද විශේෂ එකතු සමන්විත වේ.



# විද්වතුන්ගේ එකතු

- මහගත්කරු මාර්ටින් වික්‍රමසිංහ සූරීන්ගේ පෞද්ගලික එකතුව
- මහාචාර්ය ඒ.වී. සුරවීර එකතුව
- මහාචාර්ය කාල් ගුණවර්ධන එකතුව
- මහාචාර්ය ඩී.ඊ. හෙට්ටිආරච්චි එකතුව
- මහාචාර්ය මිනිවන් පී. තිලකරත්න එකතුව
- ආචාර්ය පණ්ඩිත ගුණපාල සේනාධීර එකතුව
- මහාචාර්ය රැල්ෆ් පීරිස් එකතුව

- මහාචාර්ය රසල් බෝඩින් එකතුව
- මහාචාර්ය ටිකිරි අබේසිංහ එකතුව
- මහාචාර්ය විමල විජයසූරිය එකතුව
- දොස්තර ඊ.එම්. විජේරාම එකතුව
- ආචාර්ය එච්.ජී.පී. අබේවර්ධන එකතුව
- ආචාර්ය කේ. ජයතිලක එකතුව
- ආචාර්ය එම්.එච්. පීටර් සිල්වා එකතුව
- ආචාර්ය නන්දන කරුණානායක එකතුව
- ආචාර්ය පී.බී. සන්නස්ගල එකතුව
- ආචාර්ය එස්.ජී. සමරසිංහ එකතුව
- ආචාර්ය සුසුනාග වීරප්පෙරුම එකතුව
- ඒ.පී.එස්. ගලපාත එකතුව
- සිරිල් සී. පෙරේරා එකතුව
- ඩී.සී.එම්. අල්විස් එකතුව
- බ්‍රෙන්ඩන් ගුණරත්න එකතුව
- එඩ්මන්ඩ් සමරක්කොඩි එකතුව
- ජී.ඩී. රණසිංහ එකතුව
- කේ.බී. ජිනදාස පතිරණ එකතුව
- ලයනල් ප්‍රනාන්දු එකතුව
- එම්.ජේ. පෙරේරා එකතුව
- මඩවල එස්. රත්නායක එකතුව
- මර්වින් කාසිචෙට්ටි එකතුව
- ඔලිවර් ද සොයිසා එකතුව
- පී. වත්තේගම එකතුව
- පීටර් ජයසූරිය එකතුව
- පීටර් විජේසිංහ එකතුව
- එස්.එච්. වනසිංහ එකතුව
- සුනිල් ශාන්ත එකතුව
- යූ.ඩී.අයි. සිරිසේන එකතුව
- ඩබ්ලිව්.එම්.ඒ. වර්ණසිංහ එකතුව
- තේජා ගුණවර්ධන එකතුව
- වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු එකතුව
- විභාවි විජය ශ්‍රීවර්ධන එකතුව

## වාර්තා එකතුව

වාර්ෂික වාර්තා, පරිපාලන වාර්තා, තාක්ෂණික වාර්තා, පර්යේෂණ වාර්තා ආදී වාර්තාවලින් වාර්තා එකතුව සමන්විත වේ. මෙම වාර්තා රජයේ හෝ පෞද්ගලික අංශය විසින් පළකළ ඒවා වේ. සමහර වාර්තා පළ කර ඇත්තේ රාජ්‍ය නොවන ආයතන විසිනි. වාර්තා 500 කින් පමණ යුත් වටිනා වාර්තා එකතුවක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ජාතික පුස්තකාලයට පරිත්‍යාග කර ඇත. පර්යේෂණ වාර්තා, ප්‍රගති වාර්තා, තාක්ෂණික වාර්තා, සංඛ්‍යා ලේඛන වාර්තා, සංගණන වාර්තා හා ශ්‍රී ලංකාවට අදාළ විවිධ වර්ගයේ ව්‍යාපෘති වාර්තාවලින් මෙම එකතුව සමන්විත වේ. මීට අමතරව ජාත්‍යන්තර ආධාර ආයතන විසින් අරමුදල් ලබා දෙන ලද සංවර්ධන ව්‍යාපෘතිවල අංගයක් වශයෙන් දේශීය හා විදේශීය විශේෂඥයින් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවලින් මෙම එකතුව සමන්විත වේ.

## චක්‍රලේඛ එකතුව

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් 1970 වසරේ සිට නිකුත් කරන ලද චක්‍රලේඛවලින් මෙම එකතුව සමන්විත වේ.

## නාට්‍ය අත්පිටපත් එකතුව

ජාතික පුස්තකාලය විසින් නාට්‍ය අත්පිටපත් එකතුව ගොඩනැගීම 1995 දී ආරම්භ කරන ලදී. මෙම එකතුව ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයෙන් ලැබුණු පරිත්‍යාගයකි.

## ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව

ඉගැන්වීමේ ආධාරක හෝ තොරතුරු මූලාශ්‍ර වශයෙන් යොදාගත හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සම්පත් මෙම එකතුවට ඇතුළත් කර තිබේ. මෙම එකතුව තුළ සූක්ෂම සේයා පත්‍ර (Micro Fiches) අනුසාරයෙන් තොරතුරු ඇතුළත් ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා (Annual Reports), ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන (Government Publications), ආසියා හා ශාන්තිකර සාගර කලාපයේ සමහර රටවල ජාතික ග්‍රන්ථ නාමාවලි මෙන්ම අන්තර්ජාතික මාලික අංක හා සම්බන්ධ ලේඛන





(ISSN Registers) ද ඇතුළත් වේ. ඊට අමතරව සූක්ෂම සේයා පටල (Micro films) අනුසාරයෙන් තොරතුරු ඇතුළත් ශ්‍රී ලංකා පශ්චාද් උපාධි නිබන්ධන තොරතුරු මෙන්ම සමහර ජාතික පුවත්පත්වල තොරතුරු ද ඇතුළත් වේ. මෙම ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව තුළ කැසට් පට, වීඩියෝ පට, සංයුක්ත තැටි (CD, DVD) ශ්‍රී ලාංකික ගීත ඇතුළත් ග්‍රැමෆෝන් තැටි, නාට්‍ය මෙන්ම ටෙලි නාට්‍ය ද ඇතුළත් වේ.

## පරිගණක දත්ත පදනම්

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ විවිධ අංශ යටතේ පරිගණක දත්ත පදනම් ආශ්‍රිතව ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් විවිධ නාමාවලි, අනුක්‍රමණිකා ආදිය සම්පාදනය කරනු ලැබේ. ඒවා අතර,

- ශ්‍රී ලංකා සමුළු අනුක්‍රමණිකාව (Sri Lanka Conference Index)
- පශ්චාද් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව (Index to Postgraduate Theses)
- බලතල බෙදීම හා ජනවාර්ගික ගැටළුව පිළිබඳ දත්ත පදනම (Devolution of Power and Ethnic Conflict)
- ජාතික පුස්තකාල සූචිය (National Library Catalogue)
- ජාතික ඒකාබද්ධ සූචිය (National Union Catalogue)
- ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව (Sri Lanka Paper Article Index)
- ISBN ප්‍රකාශකයින්ගේ නාමාවලිය (ISBN Publishers' Directory)






## ළමා පොත් එකතුව

ළමා පොත් එකතුව වෙනම එකතුවක් ලෙස සකස් කරන ලද්දේ මෑතකදීය. පෙර පාසල් මට්ටමේ සිට 5 ශ්‍රේණිය දක්වා සියලුම විෂයයන් පිළිබඳ පොත් මෙම එකතුවෙහි ඇතුළත් වේ.

## මණ්ඩලයීය ප්‍රකාශන එකතුව

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ විවිධ අංශ විසින් සම්පාදනය කරන ලද ප්‍රකාශනවලින් මෙම එකතුව සමන්විත වේ. මීට අමතරව මණ්ඩලයේ මූල්‍ය සහයෝගය ඇතිව විවිධ පුද්ගලයින් විසින් සම්පාදනය කරන ලද විශේෂයෙන් පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට අදාළ ප්‍රකාශනවලින් මෙම එකතුව සමන්විත වේ. දැනට මෙම එකතුව ප්‍රකාශන 224 කින් සමන්විත වේ.

## බ්‍රේල් පොත් එකතුව






රට තුළ සිටින අන්ධ හා දෘශ්‍යාබාධිත පුරවැසියන්ගේ ප්‍රයෝජනය සඳහා ජාතික පුස්තකාලය විසින් බ්‍රේල්පොත් එකතුවක් පවත්වාගෙන යනු ලැබේ. මෙම බ්‍රේල් ප්‍රකාශන, ශ්‍රී ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය, ශ්‍රී ලංකා අන්ධ ජනසේවා මණ්ඩලය (Sri Lanka Council for the Blind) හා ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත සංගමය (Sri Lanka Federation for the Visually Handicapped) විසින් මණ්ඩලය වෙත පරිත්‍යාග කරන ලදි.

# තොරතුරු ප්‍රති ඇසුරුම් එකතුව

මෙම එකතුව ගොඩනැගීම ආරම්භ කරන ලද්දේ 2000 වර්ෂයේ දී ය. පොත්, සඟරා ලිපි, පුවත්පත් ලිපි, අන්තර්ජාලය ආදී මූලාශ්‍රවලින් තොරතුරු රැස්කර තෝරාගත් මාතෘකා යටතේ සකස් කිරීම මෙම සේවය යටතේ සිදු කෙරේ. එවැනි මාතෘකාවලට නිදසුන් කිහිපයක් පහත දක්වේ.

- ළමා අපයෝජනය
- ප්‍රකාශන අයිතිය - ව්‍යාපාර වාරණය ප්‍රකාශනය හා දැනුමට ප්‍රවේශ වීම
- වඳවීමේ තර්ජනයට ලක්වූ සත්ව විශේෂ
- අනුරාධපුරයේ රජවරු හා ගොවිතැන් ක්‍රම
- අපේ රටට ආවේණික කුරුල්ලෝ
- අපේ රටට බුදු දහම හඳුන්වාදීම මහින්දාගමනයට පෙර හා පසු
- අපේ රටට සාමය අවශ්‍ය ඇයි?

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ විවිධ සේවා

## දෘශ්‍යාබාධිත පාඨකයින් සඳහා තොරතුරු සේවය
## Information Service for Visually Handicaped People

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ඩේසි ලංකා පදනමේ ද (Daisy Lanka Foundation) සහාය ඇතිව දෘශ්‍යාබාධිත පාඨකයින් සඳහා තොරතුරු සේවාවක් ජාතික පුස්තකාලය තුළ ආරම්භ කර තිබේ. දෘශ්‍යාබාධිත පාඨකයින්ගේ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි විශේෂ තොරතුරු සම්පත් ඔවුන්ට ලබාදීම මෙම සේවයේ අරමුණ වේ. දෘශ්‍යාබාධිත පාඨකයින් සඳහා ප්‍රයෝජනවත් ශ්‍රව්‍ය පොත් හා දත්ත පදනම් එකතුවක් මෙම සේවයට අයත් වේ. මෙම සේවය නිල වශයෙන් ආරම්භ කිරීම 2014 ඔක්තෝබර් මස 20 දින ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී සිදුවිය. මෙම සේවය අනාගතයේ දී අනෙකුත් පුස්තකාලවලට ව්‍යාප්ත කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය බලාපොරොත්තු වේ.

## විමර්ශන සේවය (Reference Service)

පාඨකයින්ගේ අවශ්‍යතා අනුව සමස්ත ජාතික පුස්තකාල එකතුවම උපයෝගී කරගනිමින් විමර්ශන සේවය ලබාදෙනු ලැබේ. ජාතික පුස්තකාලයේ විවිධ එකතු බිම් මහලේ, පළමු මහලේ හා දෙවන මහලේ ස්ථාපිත කර ඇති අතර මෙම මහල් තුනේ කියවීම් ශාලා පහසුකම් සපයා ඇත. වරකට පාඨකයින් 350 දෙනෙකුට පමණ ආසන පහසුකම් සපයා තිබේ.




## විමසීම් සේවය (Inquiry Service)

පාඨකයින්, පර්යේෂකයින් හා විද්වතුන් විසින් විවිධාකාරයෙන් තොරතුරු පිළිබඳ විමසීම් කරනු ලැබේ. පොත් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු (කර්තෘ, ග්‍රන්ථ නාමය, විෂය ආදී) සොයා ගැනීමට පාඨකයින්ට මග පෙන්වනු ලැබේ. මේ යටතේ ලිපි මගින්, දුරකථනයෙන්, ෆැක්ස් මගින් හා විද්‍යුත් තැපැල මගින් හෝ පෞද්ගලිකව පැමිණ සිදුකරන විමසීම් සඳහා පිළිතුරු ලබාදීම සිදුකෙරේ.



## අන්තර් පුස්තකාල පිරුළු සේවය (Inter Library Loan Service)




අන්තර් පුස්තකාල පිරුළු සේවය මගින් ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම සිටින පර්යේෂකයින්ට, බුද්ධිමතුන්ට මෙන් ම සාමාන්‍ය පාඨකයාට සේවා සැපයීමට ජාතික පුස්තකාලය කටයුතු කරයි. කිසියම් පුස්තකාලයකට අවශ්‍ය තොරතුරු නොමැති නම් ජාතික පුස්තකාලයෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට පහසුකම් සලසා ඇත. පිරුළු සේවය යටතේ ප්‍රකාශන ලබා දෙනු ලබන්නේ පුද්ගලයින්ට නොව ඉල්ලීම් කරනු ලබන පුස්තකාලයටයි. දැනට මහජන, විශේෂ හා විශ්වවිද්‍යාල පුස්තකාල සමග අන්තර් පුස්තකාල පිරුළු සේවා පවත්වාගෙන යනු ලැබේ. මෙම සේවයට සම්බන්ධ වීම සඳහා අදාළ පුස්තකාල විසින් ජාතික පුස්තකාලය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. ඒ අනුව පාඨකයින්ට පුස්තකාල හරහා එම ප්‍රකාශන පරිශීලනය කිරීමට හැකියාව පවතී. දුර්ලභ පොත් හැර අනෙකුත් පොත්, සඟරා, රජයේ ප්‍රකාශන ආදිය අන්තර් පුස්තකාල පිරුළු සේවය යටතේ ලබා දෙනු ලැබේ.

## ප්‍රවර්තන සාවධාන සේවය
## (Current Awareness Service (CAS))

ජාතික පුස්තකාලයට ලැබෙන නව ප්‍රකාශන පිළිබඳව පාඨකයින් දැනුවත් කිරීම සඳහා මෙම සේවය පවත්වාගෙන යනු ලැබේ. ප්‍රතිග්‍රහණ ලැයිස්තු හා අලුතින් ලැබෙන ප්‍රකාශන ලැයිස්තු මගින් මෙම සේවය ලබා දෙනු ලැබේ. ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ ලැයිස්තුව මාසික ප්‍රකාශනයක් වශයෙන් පළකරනු ලැබේ. ජාතික පුස්තකාලය සඳහා ලබා ගන්නා අනෙකුත් ප්‍රකාශන පිළිබඳ තොරතුරු නව ප්‍රකාශන ලැයිස්තු වශයෙන් පුස්තකාල වෙත බෙදාහරිනු ලැබේ. මෙම සේවාවන්වලට අමතරව පුවත් හසුන්, ප්‍රවෘත්ති පත්‍රිකා හා තොරතුරු සංග්‍රහ මගින් කාලීන තොරතුරු පාඨකයින් වෙත ලබා දීම, නව ප්‍රකාශන ප්‍රදර්ශනය ආදී කටයුතු සිදු කෙරේ.

# වරණීය තොරතුරු සමුද්ධරණ සේවය
# (Selective Dissemination of Information - SDI)

වරණීය තොරතුරු සමුද්ධරණ සේවය යටතේ විවිධ ක්ෂේත්‍රවලට සම්බන්ධ පර්යේෂකයින් සඳහා ඔවුන්ට අදාළ විශේෂිත තොරතුරු ලබා දෙනු ලැබේ. එම පර්යේෂකයින්ගේ විෂය අවශ්‍යතා පිළිබඳ තොරතුරු හා ඔවුන් සම්බන්ධ කරගත හැකි තොරතුරු ද ඇතුළත් කොට පාඨකයින් පිළිබඳ තොරතුරු (User Profiles) සකස් කරනු ලැබේ. එම තොරතුරු අනුව කාලීන තොරතුරු පුද්ගල මට්ටමින් හා කුඩා කණ්ඩායම් මට්ටමින් අඛණ්ඩව ලබාදෙනු ලැබේ. මෙම තොරතුරු සාරසංග්‍රහ, අනුක්‍රමණිකා, පටුන පිටු, ක්ෂණික විමර්ශන, සාහිත්‍ය ගවේෂණ ආදී ක්‍රම මගින් කඩිනමින් පාඨකයින්ට ලබා දෙනු ලැබේ.



## ලේඛන ප්‍රතිරූපන සේවය (Reprographic service)





විද්‍යුත් මාධ්‍ය පිටපත්, ස්කෑන් පිටපත් වැනි ලේඛන ප්‍රතිරූපන සේවා පවත්වා ගෙන යනු ලැබේ. මෙම සේවා ජාතික පුස්තකාල පාඨකයින්ට සහන මිලට ලබාදීමට කටයුතු යොදා ඇත. ප්‍රකාශනවල පිටපත් ලබාදීමේ දී ප්‍රකාශන හිමිකම් නීතියේ රෙගුලාසිවලට යටත්ව ක්‍රියාකරනු ලැබේ.

## අන්තර්ජාලය හා සංයුක්ත තැටි ආශ්‍රිත දත්ත පදනම් ගවේෂණ සේවාව
## (Internet and CD-ROM Database Searching Service)

ජාතික පුස්තකාලයේ අන්තර්ජාල හා සංයුක්ත තැටි ආශ්‍රිත දත්ත පදනම් මගින් ලොව පුරා ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමට පාඨකයින්ට පහසුකම් සලසා ඇත. උසස් මට්ටමේ සංයුක්ත තැටි ආශ්‍රිත දත්ත පදනම් ගණනාවක් ජාතික පුස්තකාලය විසින් ලබාගෙන ඇති අතර සංයුක්ත තැටි දත්ත පදනම් මගින් පාඨකයින්ගේ තොරතුරු ගවේෂණය සඳහා ප්‍රවේශ පහසුකම් පුළුල් කර ඇත. සංයුක්ත තැටි මගින් නොමිලේ ගවේෂණ පහසුකම් පාඨකයින්ට ලබාදී ඇත.





## තොරතුරු ප්‍රති ඇසුරුම් සේවය (Information Repackaging Service)

විශේෂයෙන් ම පාසල් සිසුන්ගේ පැවරුම් හා ව්‍යාපෘති සඳහා වැදගත්වන විවිධ මාතෘකා යටතේ තොරතුරු ප්‍රති ඇසුරුම් කට්ටල සකස් කර තිබේ. මෙම ප්‍රති ඇසුරුම් කට්ටල ශිෂ්‍යයින් විසින් විශාල වශයෙන් භාවිත කරනු ලැබේ.

## පාඨක අධ්‍යාපන සේවය (User Education Service)

ජාතික පුස්තකාල සම්පත් හා සේවා පිළිබඳ පාඨකයින් දැනුවත් කිරීම ප්‍රධාන වශයෙන්ම සිදු කරනු ලබන්නේ වර්ෂය පුරාම ක්‍රියාත්මක කරන විවිධ වර්ගයේ පාඨක අධ්‍යාපන වැඩසටහන් මගිනි. එම වැඩසටහන් පහත සඳහන් පරිදි වේ.

- පුස්තකාල සම්පත්වල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පිළිබඳ අවබෝධයක් ලබාදීමට හා විවිධ මහල්වල (බිම් මහල, පළමු මහල හා දෙවන මහල) එකතු පිහිටා ඇති ආකාරය දැන ගැනීමට මෙන්ම පරිගණක සූචිය ගවේෂණය කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාදීම.
- පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන්, විවිධ ආයතන හා උනන්දුවක් දක්වන වෙනත් කණ්ඩායම්වල ප්‍රයෝජනය සඳහා ජාතික පුස්තකාලය විසින් ජාතික පුස්තකාල අධ්‍යයන චාරිකා සංවිධානය කිරීම.



- පාඨක අධ්‍යාපන වැඩසටහනේ එක් කොටසක් වශයෙන් ජාතික පුස්තකාලයේ සම්පත් හා සේවා පිළිබඳ සම්මන්ත්‍රණ හා දේශන දිවයින පුරාම පවත්වනු ලැබේ.
- කාලානුරූපව ජාතික පුස්තකාලයේ සම්පත් පිළිබඳ ප්‍රදර්ශන පැවැත්වීම.
- ජාතික පුස්තකාල කටයුතු පිළිබඳ මහජනතාව තුළ දැනුවත්භාවය ඇති කිරීම සඳහා අත්පොත්, පෝස්ටර්, තොරතුරු පත්‍රිකා, පුවත්පත් දැන්වීම් ආදිය පළකිරීම.

## ජාතික පුස්තකාලයේ මිතුරෝ (Friends of the National Library)

ජාතික පුස්තකාලයේ ප්‍රවර්ධනය සඳහා අදහස්, යෝජනා හා විශේෂඥ දැනුම ලබාදීමට කැමැති අයට ජාතික පුස්තකාල මිතුරෝ සංවිධානයට සම්බන්ධ විය හැකිය. ජාතික පුස්තකාල මිතුරෝ සංවිධානය ස්වෙච්ඡා සංවිධානයකි. මෙහි සාමාජිකයෙකු වීමෙන් පසු ජාතික පුස්තකාලයේ කටයුතු පිළිබඳව සමීපව කටයුතු කිරීමටත්, එහි අභිවෘද්ධිය උදෙසා දායකත්වය ලබාදීමටත් හැකියාව ලැබෙනු ඇත.

## ග්‍රන්ථ විඥාපන සේවා (Bibliographic Services)

ග්‍රන්ථ විඥාපන සේවා අංශයේ ප්‍රධාන වගකීම වන්නේ පර්යේෂකයින්ගේ හා සාමාන්‍ය පාඨකයින්ගේ ප්‍රයෝජනය සඳහා රටතුළ පළවන ප්‍රකාශන පිළිබඳ තොරතුරු වාර්තාගත කර ඉදිරිපත් කිරීමයි.

මුද්‍රිත මෙන්ම මුද්‍රිත නොවන මාධ්‍ය වශයෙන් ඇති ජාතියේ බුද්ධිමය උරුමයන් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු මේ තුළින් පාඨකයින් වෙත ලබා දෙනු ලැබේ.


## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීම (Compilation of the Sri Lanka National Bibliography)




ශ්‍රී ලංකාවේ පළවන ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුළත් එකම සාධිකාරී ලේඛනය වන්නේ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියයි. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 1974 වර්ෂයේ සිට


ජාතික පුස්තකාලය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. ප්‍රධාන වශයෙන්ම නීත්‍යානුකූල තැන්පතු නීතිය යටතේ ජාතික පුස්තකාලයට ලැබෙන ප්‍රකාශන පදනම් කරගෙන ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කරනු ලැබේ. කාර්තුමය වශයෙන් පළකරන ලද ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 1994 වර්ෂයේ සිට මාසික ප්‍රකාශනයක් ලෙස පළකරනු ලැබේ. ඉදිරියේ දී පළවීමට නියමිත ප්‍රකාශන වෙනම කොටසක් වශයෙන් ''ප්‍රකාශන පූර්ව ග්‍රන්ථ නාමාවලිය'' වශයෙන් ජාතික ග්‍රන්ථ නාමාවලිය තුළ පළකරනු ලැබේ.

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (පූර්වකාලීන)
## (Sri Lanka National Bibliography (Retrospective))




ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (පූර්වකාලීන) සම්පාදනය ජාතික පුස්තකාලය විසින් 1991 වර්ෂයේදී ආරම්භ කරන ලද වැදගත් ව්‍යාපෘතියකි. 1737 සිට 1962 දක්වා වර්ෂ 225 ක කාලපරිච්ඡේදයක් මෙමගින් ආවරණය කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ පළකරන ලද ප්‍රකාශන, ශ්‍රී ලංකාව පිළිබඳව විදේශ රටවල පළකරන ලද හා විදේශ රටවල සිටින ශ්‍රී ලාංකිකයින් විසින් පළකරන ප්‍රකාශන පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් වේ. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පළවූ ප්‍රකාශන පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් වේ.

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (සමුච්චිත වෙළුම)
## (Sri Lanka National Bibliography Cumulative Volume)




ශ්‍රී ලංකාවේ පළවන වාර සඟරාවල ඇතුළත් ලිපි පිළිබඳ තොරතුරු මෙම අනුක්‍රමණිකාවේ ඇතුළත් වේ. ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව 1998 දී ආරම්භ කරන ලදි. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවලින් ශ්‍රී ලංකාවේ පළවන වාර සඟරාවල ලිපි, විදේශ

වාර සඟරාවල ශ්‍රී ලංකාව පිළිබඳව පළවන ලිපි හා විදේශ වාර සඟරාවල ශ්‍රී ලාංකිකයින් විසින් පළකරනු ලබන ලිපි පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් වේ.

මෙය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ප්‍රධාන ව්‍යාපෘතිවලින් එකකි. ජාතික ඒකාබද්ධ සූචිය ව්‍යාපෘතියට රටේ ප්‍රධාන පුස්තකාල 83 ක් දායක වේ. සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ හා විද්‍යාත්මක හා තාක්ෂණික ක්ෂේත්‍රයේ පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන මෙයට ඇතුළත් වේ. ජාතික ඒකාබද්ධ සූචිය 1996 දක්වා කාඩ්පත් සූචියක් වශයෙන් පවත්වාගෙන යන ලදි.

## ජාතික ඒකාබද්ධ සූචිය
## (National Union Catalogue (NUC/ UCAT))

ශ්‍රී ලංකාව තුළ ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීමේ කාර්යය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සිදු කරගෙන යනු ලැබේ. මේ සඳහා දැනට ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ පුස්තකාල සිය පුස්තකාලවල ඇති එකතු පිළිබඳ තොරතුරු එවීමෙන් දායක වී තිබේ. එම පුස්තකාලවල පවත්නා පොතපත පිළිබඳ තොරතුරු මෙම සූචියට ඇතුළත් කර ඇති අතර අන්තර්ජාලය ඔස්සේද ගවේෂණයට පහසුකම් සලසා දී තිබේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුස්තකාලවල ඇති පුස්තකාල සම්පත් පිළිබඳ තොරතුරු එකම ස්ථානයක සිට ගවේෂණය කිරීමේ පහසුකම ලබාදීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ජාතික ඒකාබද්ධ සූචියට තොරතුරු එවීම මගින් පාඨකයින්හට පහසුවෙන් තොරතුරු ගවේෂණයට අවස්ථාව ලැබෙන අතර දායක පුස්තකාල සහ ඒවායේ පවත්නා තොරතුරු පිළිබඳ පුළුල් ප්‍රචාරයක් ද ලැබෙනු ඇත.

## ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව
## (Sri Lanka Newspaper Article Index)


ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව ආරම්භ කරන ලද්දේ 1990 වර්ෂයේ දීය. මේ යටතේ ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත්වල පළවන වැදගත් ලිපි, අනුක්‍රමණිකා ගත කරනු ලැබේ. සමාජීය විද්‍යා මානව ශාස්ත්‍ර, විද්‍යා හා තාක්ෂණය ආදී විෂයයන්ට අදාළ ලිපි අනුක්‍රමණිකා ගතකර සිංහල දෙමළ හා ඉංග්‍රීසි වශයෙන් වෙන් වෙන්ව සකස් කරනු ලැබේ. 1995 වර්ෂයේ දී මෙය දත්ත පදනමක් වශයෙන් සකස් කරන ලදි.

## ශ්‍රී ලංකා සමුළු අනුක්‍රමණිකාව (Sri Lanka Conference Index)

ශ්‍රී ලංකාව තුළ පවත්වනු ලබන ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ විවිධ සමුළු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු ආදිය පිළිබඳ තොරතුරු එක්රැස් කොට ශ්‍රී ලංකා


සමුළු අනුක්‍රමණිකාව නමින් පරිගණක දත්ත පදනමක් සම්පාදනය කරනු ලබයි. මෙහි අරමුණ වන්නේ විවිධ සමුළු, වැඩමුළු, සම්මන්ත්‍රණ ආදිය පිළිබඳ මූලික තොරතුරු පහසුවෙන් සොයාගැනීමට පාඨක ප්‍රජාවට අවස්ථාව ලබාදීමයි. එබැවින් මෙවැනි තොරතුරු සඳහා ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීම වැදගත් වේ. මෙවැනි තොරතුරුවල පවතින දුලභතාවය අවම කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා සමුළු අනුක්‍රමණිකාව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය විසින් 1988 දී ආරම්භ කරන ලදි. 1976 - 1986, 1987 -1990, 1991-1992, 1993, 1994-1995 යන කාල පරිච්ඡේද ආවරණය කරමින් මුද්‍රිත ස්වරූපයෙන් අනුක්‍රමණිකා පහක් සම්පාදනය කර ඇත. ඉන් පසු දත්ත පදනම් ස්වරූපයෙන් මෙය සම්පාදනය කර ඇත. මෙම අනුක්‍රමණිකාව තුළ ශ්‍රී ලංකාවේ පවත්වන ලද සමුළු, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.

## පශ්චාද් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව
## (Index to Postgraduate Theses)




පශ්චාද් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව යනු ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල, පශ්චාද් උපාධි ආයතනවල, පර්යේෂණ ආයතනවල හා විශේෂ පුස්තකාල ආදී ආයතනවල ඇති පශ්චාද් උපාධි නිබන්ධන පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් මූලාශ්‍රයකි. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ඉදිරිපත් කරන ලද පශ්චාද් උපාධි නිබන්ධන හා ශ්‍රී ලාංකිකයින් විදේශ විශ්වවිද්‍යාලවලට ඉදිරිපත් කරන ලද පශ්චාද් උපාධි නිබන්ධන පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් වේ.

## ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන නාමාවලිය
## (Directory of Government Publications in Sri Lanka)





අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, පාර්ලිමේන්තුව, පළාත් සභා, පළාත් පාලන ආයතන වැනි රජයේ ආයතන විසින් පළකරනු ලබන ප්‍රකාශන පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සැපයීම මෙම නාමාවලිය සම්පාදනයේ අරමුණු වේ. පනත් කෙටුම්පත්, පනත්, ආඥාපනත්, පාර්ලිමේන්තු විවාද (හැන්සාඩ් වාර්තා), සැසි වාර්තා, ගැසට්පත්‍ර, ශ්‍රී ලංකා නීති වාර්තා, පරිපාලන වාර්තා, වාර්ෂික වාර්තා, අත්පොත්, මාර්ගෝපදේශ ග්‍රන්ථ, ව්‍යාපෘති වාර්තා

ආදි ප්‍රකාශන පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් වේ. ප්‍රතිපත්ති තීරකයින්ට මෙන් ම පර්යේෂකයින්, රජයේ නිලධාරීන්, විද්වතුන් හා රජයේ ප්‍රකාශන පිළිබඳ තොරතුරු සොයන අනෙකුත් ඕනෑම අයෙකුට මෙම නාමාවලිය ප්‍රයෝජනවත් මූලාශ්‍රයකි. මෙම නාමාවලිය ප්‍රකාශනය 1990 දී ආරම්භ කරන ලද අතර දැනට වෙළුම් 11 ක් පළකර තිබේ. දැනට මෙය මාර්ගගත දත්ත පදනමක් ලෙස පවත්වාගෙන යනු ලැබේ.

## ප්‍රකාශනගත සූචිකරණ දත්ත
## (Cataloguing-In-Publication (CIP))


පුස්තකාලවල සූචිකරණ කටයුතු පහසුකරලීමේ හා ඒකමිතියක් ඇති කිරීමේ අරමුණු ඇතිව ප්‍රකාශනගත සූචිකරණ දත්ත ව්‍යාපෘතිය 1996 දී ආරම්භ කරන ලදි. ප්‍රකාශනගත සූචිකරණ දත්තවල එක් වාසියක් නම් මේ මගින් පුස්තකාල පොත් සූචිකරණ හා වර්ගීකරණ කටයුතුවල දී පුස්තකාලයාධිපතිවරුන්ට පහසුවක් ලබාදීමයි. ප්‍රකාශනගත සූචිකරණ දත්ත නිකුත් කරනු ලබන්නේ ප්‍රකාශනයක් මුද්‍රණය කිරීමට පෙරය. කර්තෘ, ග්‍රන්ථ නාමය, ප්‍රකාශක, ප්‍රකාශන ස්ථානය, වර්ෂය, ISBN හා ISMN අංක, ඩිවි දශම වර්ගීකරණ (DDC) අංකය, කොංග්‍රස් පුස්තකාල විෂය ශීර්ෂ ආදී තොරතුරු ප්‍රකාශනගත සූචිකරණ දත්ත වල ඇතුළත් වේ.


## සිංහල ග්‍රන්ථ නාම සාධිකාරී ලේඛනය
## (Authority List of Sinhala Titles)




සිංහල සාහිත්‍ය ග්‍රන්ථ සංස්කරණය කිරීමේ දී ග්‍රන්ථ නාමය විවිධාකාරයෙන් යොදා ඇති බැවින් පුස්තකාලවල තොරතුරු සංවිධානය දුෂ්කර කාර්යයක් බවට පත්ව ඇත. එබැවින් සාධිකාරී ලේඛනයක අරමුණ සියලුම සංස්කරණවල ග්‍රන්ථනාම ඒකීය ග්‍රන්ථ නාමයක් යටතට ගෙන ඒමයි. පුස්තකාලවල සූචිකරණ කටයුතුවලදී සමරූපී බවක් ඇති කර ගැනීමට මෙය ප්‍රයෝජනවත් මාර්ගෝපදේශයක් වේ. එමෙන්ම මේ තුළින් ද්විත්වකරණය වළක්වා සිංහල සාහිත්‍යයට අදාළව තොරතුරු සෙවීමේ පහසුව ඇති කරයි.


## කර්තෘ නාම සාධිකාරී ලේඛනය (සිංහල හා දෙමළ)
## (Authority List of Authors (Sinhala and Tamil))




සාධිකාරී ලේඛන සම්පාදනය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රධාන වගකීමකි. මෙම ව්‍යාපෘතියේ අරමුණ ජාතික මට්ටමින් සාධිකාරී තොරතුරු බෙදා ගැනීම වේ. පැරණි සාහිත්‍ය කෘති සංස්කරණය කිරීමේ දී කර්තෘවරුන්ගේ නම් විවිධාකාරයෙන් යොදා ඇත. කර්තෘවරුන්ගේ නම්වල වෙනස්කම් නිසා තොරතුරු සංවිධානය දුෂ්කර කාර්යයක් බවට පත්ව ඇත. එබැවින් සාධිකාරී ලේඛනයක අරමුණ සියලුම සංස්කරණවල විවිධ ස්වරූපයන්ගෙන් ඇති කර්තෘ නාම එක් පොදු කර්තෘ නාමයක් යටතට ගෙන ඒමයි. සූචිකරණ කටයුතුවලදී ඒකමිතියක් ඇති කර ගැනීමට මෙය ප්‍රයෝජනවත් මූලාශ්‍රයකි. සිංහල හා දෙමළ ග්‍රන්ථ නාමවල ගවේෂණ පහසුව ඇති කර ගැනීමටත් ද්විත්වකරණය වළක්වා ගැනීමටත් මෙය උපකාරී වේ.

## ශ්‍රී ලංකාවේ පර්යේෂණ වාර්තා පිළිබඳ අනුක්‍රමණිකාව
## (Index to Research Reports in Sri Lanka)




ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, පශ්චාද් උපාධි ආයතන, පර්යේෂණ ආයතන හා විද්වතුන් විසින් සම්පාදනය කරන ලද පර්යේෂණ වාර්තා පිළිබඳ තොරතුරු මෙම අනුක්‍රමණිකාවේ ඇතුළත් වේ. පර්යේෂකයින්ට, විද්වතුන්ට, ශිෂ්‍යයින්ට මෙන්ම ශ්‍රී ලංකාවට අදාළ පර්යේෂණ වාර්තා පිළිබඳ තොරතුරු සොයන සියලුම පාඨකයින්ට මෙම අනුක්‍රමණිකාව ප්‍රයෝජනවත් මූලාශ්‍රයකි. මෙම අනුක්‍රමණිකාව සම්පාදනය 2005 දී ආරම්භ කරන ලද අතර 2005 - 2009 කාලපරිච්ඡේදය ආවරණය කරමින් පළමු හා දෙවන වෙළුම් ප්‍රකාශයට පත් කර ඇත.

# සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන සේවා
# (Conservation and Preservation Services)



සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන සේවාවේ කාර්යභාරය වන්නේ ජාතික පුස්තකාල සම්පත් සංරක්ෂණය කිරීම හා ප්‍රතිෂ්ඨාපනය කිරීම වේ.

- ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගෙන ඇත. ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ මැද කොටසේ ජාතික පුස්තකාල එකතුව තැන්පත් කර ඇති අතර පොත් එකතු ප්‍රදේශය තුළ වායු සමීකරණය හා ආර්ද්‍රතා පාලනය සිදුකරනු ලැබේ.

- ජාතික එකතුව සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

  - අඛණ්ඩ පිරිසිදු කිරීම් සිදු කිරීම.
  - කෘමීන්ගෙන් හා ක්ෂුද්‍ර ජීවීන්ගෙන් වන හානි වැළැක්වීම සඳහා ධූමායනය සිදු කිරීම.
  - නිරාම්ලීකරණය.
  - ලේඛන ප්‍රතිසංස්කරණය.
  - කෘමි පාලනය.

- දුර්ලභ ලේඛන ප්‍රතිසංස්කරණය.
- පොත් බැඳීම.

- මහජන පුස්තකාල ආශ්‍රිතව දීපව්‍යාප්ත ලෙස සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම.
- මහජන පුස්තකාලවල සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන මධ්‍යස්ථාන සඳහා සංරක්ෂණ පිරිවිතර හා නිර්නායක ලබා දීම.
- සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන කටයුතුවලට අදාළව පත්‍රිකා, අත්පොත්, පෝස්ටර් ආදිය ප්‍රකාශයට පත් කිරීම.
- උපදේශක සේවා මගින් රටේ අනෙකුත් පුස්තකාල සඳහා පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ උපදෙස් සැපයීම.
- යුනෙස්කෝ 'ලෝකයේ මතකය' (Memory of the World) ව්‍යාපෘතියේ ජාතික මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කිරීම.
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය (ICH) සංරක්ෂණය කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.
- සියලුම පුස්තකාල වර්ගවල කාර්යමණ්ඩල, සංරක්ෂණ මධ්‍යස්ථාන හා ලේඛනාගාර භාරව කටයුතු කරන පුද්ගලයින් මෙන්ම විද්‍යාත්මක සංරක්ෂණ ක්‍රම පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට කැමැත්තක් දක්වන පුද්ගලයින් සඳහා පුස්කොළ පොත් සංරක්ෂණය, පොත් බැඳීම, ලේඛන ප්‍රතිසංස්කරණය, පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය ආදී අංශ පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම.
- පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා සාම්ප්‍රදායික ශාකමය තෙල් විශේෂයක් ''පන්හිඳ'' නමින් නිෂ්පාදනය කරයි. මෙම ව්‍යාපෘතියේ අරමුණ දිවයින පුරා ඇති පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමයි.



## ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ඉෆ්ලා කලාපීය සංරක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස (IFLA PAC) නම් කිරීම



ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ (IFLA) කලාපීය සංරක්ෂණ මධ්‍යස්ථානයක් වශයෙන් 2015 අගෝස්තු 05 වන දින පැවති ජාතික පුස්තකාලයේ 25වන සංවත්සර උත්සවයේ දී අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ පාලක මණ්ඩල සාමාජික ගියැන් ලෙක් චෝ (Ngian Lek Choh) මහත්මිය විසින් ප්‍රකාශයට පත්කරන ලදි.

## තොරතුරු තාක්ෂණ සේවා (Information Technology Services)

ජාතික පුස්තකාලයේ කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය උපයෝගී කරගැනීමට අදාළ කටයුතු හා වෙනත් පුස්තකාලවල තොරතුරු තාක්ෂණය යොදාගැනීම සඳහා සහයවීම මේ යටතේ සිදු කෙරේ.

### ජාතික මට්ටමේ තොරතුරු තාක්ෂණ සේවා

- ශ්‍රී ලංකාවේ පුස්තකාල අතර තොරතුරු තාක්ෂණය ජනප්‍රිය කිරීම.
- මූලික තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති වාර්තා සකස් කිරීම සඳහා සහාය වීම.
- දෘඪාංග පිළිබඳ තාක්ෂණික අගැයීම.

- තොරතුරු තාක්ෂණයට අදාළව පුස්තකාල සඳහා උපදේශක සේවා සැපයීම.
- පුස්තකාල සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීමට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පුස්තකාලයාධිපතීන් හා පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා පුස්තකාලවල තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සම්මන්ත්‍රණ හා දේශන මගින් තොරතුරු තාක්ෂණ දැනුම ප්‍රවර්ධනය.
- අවශ්‍ය තොරතුරු තාක්ෂණ උපකරණ ලබා ගැනීම සඳහා අරමුදල් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම.
- ජාතික පුස්තකාල වෙබ් අඩවිය පවත්වාගෙන යාම තොරතුරු යාවත්කාලීන කිරීම හා නවීකරණය.
- ජාතික පුස්තකාල අවශ්‍යතාවන් අනුව ජාතික පුස්තකාලයේ වෙබ් සේවා පරිගණකය (web server) හා මේල් සේවා පරිගණකය (mail server) පවත්වාගෙන යාම.
- අන්තර්ජාල ගවේෂණය සම්බන්ධයෙන් පාඨක සේවා අංශයට හා ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලයට තාක්ෂණික උපදෙස් හා සහාය ලබාදීම.
- අභ්‍යන්තර පරිගණක ජාලය (LAN) පවත්වාගෙන යාම, පුළුල් කිරීම, ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා ආරක්ෂාව ඇති කිරීම.
- ප්‍රකාශන සංඛ්‍යාංකකරණය කිරීම හා සංඛ්‍යාංක එකතුව (digital collection) ගොඩනැගීම.
- ජාතික පුස්තකාලය සඳහා Koha මෘදුකාංගය 2015 අප්‍රේල් මාසයේ සිට භාවිතයට ගැනීමට කටයුතු යොදා තිබේ.



## පුස්තකාල පර්යේෂණ කටයුතු (Library Research Activities)

පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු සිදුකිරීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට පැවරෙන වගකීමකි. මේ යටතේ මණ්ඩලයේ පුස්තකාල පර්යේෂණ අංශය විසින් පහත සඳහන් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනු ලැබේ.

- තෝරාගත් කාලීන මාතෘකා පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.
- විවිධ වර්ගයේ පුස්තකාලවල වත්මන් තත්ත්වයන් අවබෝධකරගැනීම සඳහා සමීක්ෂණ පවත්වා තොරතුරු සංග්‍රහ සම්පාදනය
- ශ්‍රී ලංකාවේ පුස්තකාල කටයුතු පිළිබඳව සංඛ්‍යාලේඛන අත්පොත සම්පාදනය
- පුස්තකාලයාධිපතීන් සඳහා පර්යේෂණ ක්‍රමවිද්‍යාව පිළිබඳ වැඩමුළු පැවැත්වීම.

## ව්‍යාප්ති සේවා (Extension Services)

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ව්‍යාප්ති සේවා අංශය විසින් ශ්‍රී ලංකාවේ මහජන, පාසල්, දෙපාර්තමේන්තු හා විශේෂ පුස්තකාල සඳහා සේවා සපයනු ලැබේ. ජාතික මට්ටමින් පුස්තකාල සේවා සැලසුම් කිරීම හා සංවර්ධනය, පුස්තකාල කටයුතු පිළිබඳ උපදෙස් ලබාදීම, පුස්තකාල ප්‍රමිති සම්පාදනය ආදිය ප්‍රධාන ව්‍යාප්ති සේවාවන් වේ. මෙම ව්‍යාප්ති සේවාවන් හි අරමුණු වන්නේ රටේ පුස්තකාල විශිෂ්ට තොරතුරු සම්පත් මධ්‍යස්ථාන බවට පත් කිරීමත් ඒමගින් ජාතියේ තොරතුරු අවශ්‍යතා සපුරාලීමත්ය.

- **පුස්තකාල සංවර්ධනය හා උපදේශක සේවා**
  - පුස්තකාල ගොඩනැගිලි සැලසුම්කරණය හා අභ්‍යන්තර සැලසුම්කරණය පිළිබඳ උපදෙස් ලබාදීම.
  - පුස්තකාල උපකරණ පිළිබඳව වෘත්තිය උපදෙස් ලබාදීම.
  - පුස්තකාල ද්‍රව්‍ය සංවිධානය හා එකතු සංවර්ධනයට අදාළව උපදෙස් දීම හා සහාය වීම.
  - පුස්තකාල සේවා සංවිධානය කිරීම.
  - පුස්තකාලවල තොරතුරු තාක්ෂණය යොදා ගැනීම පිළිබඳව උපදෙස් ලබාදීම.

■ පුස්තකාල ප්‍රමිති සම්පාදනය.

රටතුළ ඇති මහජන, පාසල්, දෙපාර්තමේන්තු හා විශේෂ පුස්තකාල සඳහා ප්‍රමිති සම්පාදනය හා යාවත්කාලීන කිරීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් ඉටු කරනු ලබයි.



■ පුස්තකාල ඇගයීම හා ශ්‍රේණිගත කිරීම

පුස්තකාල ප්‍රමිති උපයෝගී කර ගනිමින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් පුස්තකාල ඇගැයීම හා ශ්‍රේණිගත කිරීම සිදුකරයි. ඒ යටතේ තුන්වන, දෙවන, පළමු හා අධිශ්‍රේණිය යන ශ්‍රේණිවලට පුස්තකාල ශ්‍රේණිගත කරනු ලබයි. මේ තුළින් තම පුස්තකාල හා පුස්තකාලයාධිපතිවරුන්ගේ තත්ත්වය ඉහළ මට්ටමකට ගෙන ඒමටත් පුරප්පාඩු පුරවා ගැනීමටත් හැකියාව ලැබේ.

■ පළාත් සහා පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතිය

පළාත් සභා පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ පළාත් මට්ටමින් පුස්තකාල සංවර්ධන ක්‍රියාවලිය සඳහා පළාත් සභා ද සම්බන්ධ කර ගැනීමේ අරමුණ ඇතිවය. මේ යටතේ පළාත් කිහිපයක පුස්තකාල ප්‍රඥප්ති සකස් කිරීමටත් පළාත් පුස්තකාල සේවා මණ්ඩල පිහිටුවීමටත් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහායවී තිබේ. දැනට පහත සඳහන් පළාත්වල පුස්තකාල සේවා මණ්ඩල පිහිටුවනු ලැබ ඇත.

(1) මධ්‍යම පළාත් පුස්තකාල සේවා මණ්ඩලය
(2) ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය
(3) උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලය
(4) සබරගමුව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය

ඉල්ලීම් කරන අවස්ථාවල දී මෙම මණ්ඩලවල කටයුතු සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සම්බන්ධ වේ. මෙම පළාත් පුස්තකාල සේවා මණ්ඩලවල අධ්‍යක්ෂ මණ්ඩලවල සාමාජිකයෙකු වශයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කරයි.

- **පුස්තකාල සඳහා පොත් පරිත්‍යාග කිරීම**

පුස්තකාල සඳහා පොත් පරිත්‍යාග කිරීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ තවත් වැදගත් කාර්යයකි. පොත් පත් අවශ්‍යව ඇති මහජන, පාසල්, දෙපාර්තමේන්තු, පිරිවෙන් හා විශේෂ පුස්තකාල සඳහා දේශීය පොත් පරිත්‍යාග වශයෙන් ලබා දෙනු ලැබේ.

- **කියවීම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ව්‍යාප්ති සේවා අංශය විසින් තෝරාගත් අඩු පහසුකම් සහිත පාසල්වල කියවීම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ළමා පොත් රචිත ලේඛකයින් විසින් පවත්වනු ලබන දේශනවලට අමතරව මෙම පාසල් සඳහා පොත් පරිත්‍යාග ලබාදෙනු ලැබේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් මෙම වැඩසටහන් පාසල්වල සංවිධානය කරනු ලැබේ.

- **පොත් ප්‍රදර්ශන පැවැත්වීම**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් මණ්ඩලයීය පරිශ්‍රයේදී මෙන්ම ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලද පොත් ප්‍රදර්ශන පවත්වනු ලැබේ. මෙම පොත් ප්‍රදර්ශනවලදී පොත් සඳහා විශේෂ වට්ටම් ලබාදෙන අතර මේ තුළින් මහජන හා පාසල් පුස්තකාල විශාල ප්‍රමාණයකට ප්‍රතිලාභ අත්වේ.



■ **ජාත්‍යන්තර හා ජාතික දින හා මාස සැමරීම**

පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර හා ජාතික දින හා මාස සැමරීම සිදු කරනු ලැබේ.

(1) ජාත්‍යන්තර පොත් හා ප්‍රකාශන හිමිකම් දිනය
(2) අන්තර්ජාතික පාසල් පුස්තකාලයාධිපතීන්ගේ දිනය
(3) ජාතික පුස්තකාල සතිය
(4) සාහිත්‍ය මාසය
(5) ජාතික කියවීමේ මාසය

■ **ජාතික කියවීමේ මාසය ව්‍යාපෘතිය**

ජාතික කියවීමේ මාසය ආරම්භ කරන ලද්දේ 2004 වර්ෂයේ දීය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ නිර්දේශය මත ඔක්තෝබර් මාසය ''ජාතික කියවීමේ මාසය'' වශයෙන් රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ

- ප්‍රකාශිත පොත් පිළිබඳව ජනතාව අතර අවබෝධයක් ඇති කිරීම.
- පොත් කියවීමට ජනතාව දිරිගැන්වීම.

මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය පහත සඳහන් කාර්යයන් ඉටු කරයි.

(1) ජාතික කියවීමේ මාසය පිළිබඳ පුස්තකාල අතර අවබෝධයක් ඇතිකිරීම
(2) ප්‍රාදේශීය මට්ටමින් කියවීම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන පුස්තකාල අගැයීම.
(3) ජාතික කියවීමේ මාසයට අදාළව සම්මන්ත්‍රණ, කියවීමේ කඳවුරු, තරඟ ආදිය සංවිධානය කිරීම.
(4) ජාතික කියවීමේ වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම.

■ **ජාතික පුස්තකාල පොත්හල**

ජාතික පුස්තකාල පොත්හල මගින් ජාතික පුස්තකාල ප්‍රකාශන හා වෙනත් කර්තෘවරුන්ගේ ප්‍රකාශන සහන මිලකට අලෙවි කරනු ලැබේ. මෙම පොත් මිලදී ගැනීමේ දී විශේෂ වට්ටම් ලබාදෙනු ලැබේ. පොත්වලට අමතරව සූචි කාඩ්පත්, දින පත්‍රිකා, පොත් තුන්ඩු, පරිග්‍රහණ ලේඛන හා පුස්තිකා පෙට්ටි ආදී පුස්තකාල ලිපිද්‍රව්‍ය ද ජාතික පුස්තකාල පොත් හලෙන් මිලදී ගත හැකිය.

# අධ්‍යාපන හා පුහුණු සේවා
# (Education and Training Services)

විවිධ පුස්තකාල වර්ගවල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, පුස්තකාලයාධිපතීන් සඳහා සේවස්ථ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, දේශන ආදිය සංවිධානය කිරීම, පුස්තකාල ක්‍රියාත්මක වන ආයතනවල ප්‍රධානීන් සඳහා දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ පැවැත්වීම, අධ්‍යාපන හා පුහුණු සේවාවල ප්‍රධාන කාර්යභාරය වේ. මෙම වැඩසටහන් තුළින් රටේ පුස්තකාල වෘත්තිකයින්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායිත්වය වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

- **ජාතික මට්ටමේ හා පළාත් මට්ටමේ ආයතන හා සංවිධාන සමග සම්බන්ධීකරණය**

  (1) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, පළාත් පාලන අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන ආයතන.

  (2) අධ්‍යාපන අමාත්‍යාංශය හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

  (3) කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යනාංශය.

  (4) කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික ආයතනය.

  (5) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය.

  (6) පළාත් පුස්තකාල සේවා මණ්ඩල

- **පාසල් පුස්තකාලයාධිපතීන් හා පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන්**

  (1) විවිධ ප්‍රදේශවල පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන්.

  (2) ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් සම්මන්ත්‍රණ පැවැත්වීම.



- **මහජන පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු පාඨමාලා**

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලයාධිපතීන් හා පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා පුහුණු පාඨමාලා වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම.

- **පිරිවෙන් පුස්තකාල භාරව සිටින නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්.**

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල පිරිවෙන් පුස්තකාල භාරව සිටින නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්.



- **ගුරුවිද්‍යාල හා අධ්‍යාපන විද්‍යාපීඨවල කාර්ය මණ්ඩල හා ආධුනිකයින් සඳහා පුහුණු වැඩසටහන්**

දිවයින පුරා ඇති ගුරු විද්‍යාල හා අධ්‍යාපන විද්‍යාපීඨ, පුස්තකාල කාර්ය මණ්ඩල හා ආධුනිකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- **සංරක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන්.**

සංරක්ෂණය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- **පුස්කොළ පොත් සංරක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන්.**

- **ලේඛනාගාර භාරව සිටින නිලධාරීන් සඳහා ලේඛන සංරක්ෂණය හා පොත් බැඳීම පිළිබඳ පුහුණු වැඩසටහන්.**

- **විවිධ වර්ගවල පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.**

- මුද්‍රණකරුවන්/ ප්‍රකාශකයින්/ ලේඛකයින් සඳහා පොත් ප්‍රකාශනය හා මුද්‍රණ ක්‍රම පිළිබඳ වැඩමුළු.

- පුස්තකාලයාධිපතීන් සඳහා වෙනත් පුහුණු වැඩසටහන්.

  (1) ප්‍රලේඛන මූලාශ්‍ර සම්පාදනය.

  (2) පුස්තකාල සම්පත් සූචිකරණය හා වර්ගීකරණය.

  (3) පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් හා විවිධ ආයතනවල පුස්තකාල හා විඥාපන පාඨමාලා හදාරණ සිසුන් සඳහා ජාතික පුස්තකාල අධ්‍යයන චාරිකා සංවිධානය.



- ජාතික පුස්තකාල මාසික දේශන මාලාව

සාමාන්‍ය ජනතාවගේ දැනුම පුළුල් කිරීම, ජාතික පුස්තකාලය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම, ජාතික පුස්තකාලය වෙත පාඨකයින් ආකර්ෂණය කර ගැනීම යන මූලික අරමුණු සපුරා ගැනීම සඳහා මාසික දේශන මාලාව වර්ෂ 1990 ජූනි මාසයේ සිට පවත්වාගෙන යනු ලැබේ. ඉතිහාසය, සංස්කෘතිය, සාහිත්‍ය, පුස්තකාල හා විඥාපන විද්‍යාව ආදී විෂය ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රමුඛ පෙළේ ශ්‍රී ලාංකික හා විදේශීය විද්වතුන් විසින් ජාතික පුස්තකාල දේශන මාලාවට සම්බන්ධ කරගනු ලැබේ.

1033478



# ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන කටයුතු
# Publication and Book Development ISBN, ISSN, ISMN

පාඨකයින් සඳහා ඉහළ ගුණාත්මක බවින් යුත් පොතපත නිර්මාණය කිරීම හා රටතුළ පොත් ප්‍රකාශනයේ සංවර්ධනයක් ඇති කිරීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රධාන වගකීමක් වේ.

ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය, නව ප්‍රකාශන මිල දී ගැනීමේ ව්‍යාපෘතිය, පැරණි සම්භාව්‍ය කෘති සංස්කරණය හා පළකිරීම, ජාතික පුස්තකාල ප්‍රකාශන පළකිරීම, අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය (ISBN), අන්තර් ජාතික ප්‍රමිති මාලික අංක ව්‍යාපෘතිය (ISSN), අන්තර් ජාතික ප්‍රමිති සංගීත අංක ව්‍යාපෘතිය (ISMN), පොත් ප්‍රකාශන කටයුතුවලට අදාළ උපදෙස් ලබාදීම මේ යටතේ සිදු කරන ප්‍රධාන කාර්යයන් වේ.

- ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය 1984 වසරේ දී ආරම්භ කළ අතර 2016 වසරේ සිට ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් (04) යටතේ ශ්‍රී ලාංකික ලේඛකයින් සඳහා අනුග්‍රහය දක්වනු ලැබේ.

(1) පර්යේෂණාත්මක ශාස්ත්‍රීය කෘති

(2) සාහිත්‍ය හා නිර්මාණාත්මක පරිවර්තන හා විවිධ විෂයන්ට අදාළ කෘති

(3) යොවුන් සාහිත්‍ය කෘති

(4) ළමා සාහිත්‍ය කෘති

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු අතර,

(1) ගුණාත්මක දේශීය ප්‍රකාශන සුලභ කිරීම.

(2) රටේ ප්‍රකාශන කර්මාන්තය සඳහා සහායවීම.

(3) කර්තෘවරුන් පරිවර්තකයින් වැනි නිර්මාණකරුවන්ට සහායවීම.

(4) ප්‍රකාශනවල ගුණාත්මක බව හා ප්‍රමිතිය ඉහළ නැංවීම.

(5) කියවීමේ රුචිය වර්ධනය කිරීම.


(6) ප්‍රකාශනවල මිල සාධාරණ මට්ටමක පවත්වාගෙන යාම.

(7) ජාතික මට්ටමින් පුස්තකාල සේවා ප්‍රවර්ධනය කිරීම.

- **නව ප්‍රකාශන මිලදී ගැනීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ පවත්නා වර්ෂයේ හා පූර්ව වර්ෂයේ මුද්‍රිත ප්‍රකාශන මිල දී ගැනීම මගින් ශ්‍රී ලාංකීය ලේඛකයින් වෙත අනුග්‍රහය දක්වනු ලැබේ.

- **ප්‍රලේඛා සඟරාව පළකිරීම**




ත්‍රෛමාසික ප්‍රකාශනයක් ලෙස මණ්ඩලය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන සඟරාව මගින් නූතන සාහිත්‍ය ප්‍රවණතා පිළිබඳ සාකච්ඡා කෙරේ.

- **පැරණි සම්භාව්‍ය කෘති සංස්කරණය**

මෙය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ක්‍රියාත්මක කරන තවත් සාහිත්‍යමය සේවාවකි. මෙම ව්‍යාපෘතිය යටතේ පූජාවලිය, පන්සිය පනස් ජාතකය, මහාවංශය යන කෘති සංස්කරණය කර ප්‍රකාශයට පත් කර තිබෙන අතර බුත්සරණ ග්‍රන්ථය ඉදිරියේ දී ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

- **අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක (ISBN) මාලික අංක (ISSN) හා සංගීත අංක (ISMN) ක්‍රියාත්මක කිරීමේ ජාතික මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කිරීම.**

අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක, මාලික අංක හා සංගීත අංක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ජාතික මධ්‍යස්ථානය වශයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු සිදු කරනු ලැබේ.

- **අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය** (ISBN)

ශ්‍රී ලංකාවේ පළවන සියලුම පොත් හඳුනා ගැනීමේ ක්‍රමයක් ලෙස අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය හැඳින්විය හැකි අතර මෙම අංකය අනන්‍ය වූ අංකයකි.

මෙම අංකය සංඛ්‍යා දහතුනකින් සමන්විත ජාත්‍යන්තර වශයෙන් පිළිගත් අංකයකි. මෙම ව්‍යාපෘතියේ ජාතික මධ්‍යස්ථානය වශයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කරයි. වානිජ මට්ටමේ ප්‍රකාශන රජයේ හා රාජ්‍ය නොවන ආයතන සහ කර්තෘ/ පෞද්ගලික ප්‍රකාශකයින් යන වර්ගවලට අයත් ප්‍රකාශකයින්ගේ ප්‍රකාශන සඳහා අංක ලබාදෙනු ලැබේ.

**අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය තුළින් ප්‍රකාශකයින්ට ලැබෙන ප්‍රයෝජන**

පොත් ප්‍රකාශනයට අදාළ පහත සඳහන් කාර්යයන්වලදී මෙම අංකය ප්‍රයෝජනවත් වේ.

(1) තොග පාලනය

(2) ඇණවුම් කිරීම

(3) ගිණුම් පවත්වාගෙන යාම හා බිල්පත් නිකුත් කිරීම

**පුස්තකාලවල පහත සඳහන් කටයුතු සඳහා අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය ප්‍රයෝජනවත් වේ.**

(1) ඇණවුම් කිරීම

(2) සූචිකරණය

(3) තොරතුරු ගවේෂණය

(4) සූචිකරණ දත්ත ගවේෂණය හා බාගත කර ගැනීම

(5) සංසරණය හා අන්තර් පුස්තකාල හුවමාරු සේවා

(6) ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය.

■ **අන්තර්ජාතික ප්‍රමිති මාලික අංක ව්‍යාපෘතිය (ISSN)**

INTERNATIONAL STANDARD SERIAL NUMBER INTERNATIONAL CENTRE

වාර සඟරා, පුවත්පත්, වාර්ෂික වාර්තා, වාර්ෂික ග්‍රන්ථ නාමාවලි, සමුළු වාර්තා ආදී මාලික ප්‍රකාශන හඳුනා ගැනීම සඳහා වන අංක අටකින් යුත් අනන්‍ය අංකයක් ලෙස අන්තර් ජාතික ප්‍රමිති මාලික අංකය (ISSN) හැඳින්විය හැකිය. ඇණවුම් කිරීම, තොග ලේඛන පාලනය, ග්‍රන්ථ පිරිසැකසුම හා තොරතුරු ගවේෂණය ආදී කටයුතු අන්තර් ජාතික ප්‍රමිති මාලික අංකය මගින් පහසු කරයි.

■ **අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංක (ISMN) ව්‍යාපෘතිය**

අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංකය යනු සියලුම සංගීත ප්‍රකාශන හඳුනා ගැනීම සඳහා වන සංඛ්‍යා දහතුනකින් සමන්විත අනන්‍ය අංකයකි.

**අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංකයේ ප්‍රයෝජන**

(1) සංගීත ප්‍රකාශන හඳුනා ගැනීමට සහාය වීම.

(2) පොත් ඇණවුම් කිරීමට සහාය වීම.

(3) පොත් බෙදා හැරීමට සහාය වීම.

(4) සංගීත ප්‍රකාශන පිළිබඳ වෙළඳ නාමාවලි සම්පාදනය පහසු කිරීම.

(5) විවිධ පරිගණක ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා සහාය වීම.


■ **සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම**

පොත් ප්‍රකාශනය හා ප්‍රමිති පිළිබඳව කර්තෘවරුන්, ප්‍රකාශකයින් හා මුද්‍රණකරුවන් සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම මෙම සම්මන්ත්‍රණ හා වැඩමුළු මගින් කර්තෘවරුන් ප්‍රකාශකයින් හා මුද්‍රණකරුවන් දැනුවත් කිරීම සිදු කෙරේ.


# පුස්තකාල සහයෝගිතා වැඩසටහන්
# (Library Co-operation Programme)

පුස්තකාල සහයෝගිතා වැඩසටහනේ අරමුණ වන්නේ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පුස්තකාල සහයෝගිතාවය වර්ධනය කිරීමයි. අනෙකුත් පුස්තකාල, IFLA, ALA COMLA, UNESCO, CDNLO, REFSALA, IASL වැනි පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ ආයතන හා ලෝකයේ අනෙකුත් ජාතික පුස්තකාල සමග සහයෝගිතාවය වර්ධනය කරගැනීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

- පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය සංගම් සමග සම්බන්ධතා පවත්වාගෙන යාම.
- පුස්තකාලයාධිපතිවරුන්ගේ වෘත්තීය දැනුම වර්ධනය කිරීම හා ඔවුන්ගේ ගැටලු සාකච්ඡා කිරීම.
- බඳවා ගැනීම් හා පත් කිරීම්වලට අදාළ ගැටලු පැහැදිලි කර ගැනීම සඳහා පුස්තකාලයාධිපතිවරුන් හා ආයතන විසින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සම්බන්ධ කරගනු ලැබේ. මෙම ගැටලු ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් අදාළ බලධාරීන් වෙත සලකා බැලීම සඳහා යොමු කරනු ලැබේ.
- මෙරට ඇති පුස්තකාලවලට අදාළ නීති රෙගුලාසි හා චක්‍රලේඛවල ඇති අඩුපාඩු හඳුනාගැනීම හා අදාළ ලේඛන සංශෝධනය කිරීමට සහායවීම.
- ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය වැනි පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතන සමග සමීප සබඳතා පවත්වාගෙන යාම.



**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
14, නිදහස් මාවත,
කොළඹ 07.
දුරකථන: 0112698847, 2685197
ෆැක්ස්: 0112 685201
ඊමේල්: info@mail.natlib.lk
යූආර්එල්: www.ítlib.lk



ISBN 978-955-7544-20-5

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත, කොළඹ 07.

2017

**National Digitization Project**

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 20/10/2017

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : Naveen

Signature : [signature]

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : [signature]

Date : 20/10/2017

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*